සම්භාහන ආයතනයකට පැමිණි විදෙස් කාන්තාවකට ලිංගික අතවර කිරීම සම්බන්ධයෙන් එහි සේවය කරන වෛද්‍යවරයෙකු ලෙසින් පෙනී සිටි අයෙකු අධිකරණයට ඉදිරිපත් කිරීම පිළිබඳ පුවතක් දිවයින (11/12) සහ අරුණ (11/12) පුවත්පත් තුළ ඉදිරිපත් වී තිබිණි.

එහිදී, "විදෙස් තරුණිය සම්භාහනය කරද්දී පිටපොට පැන්න ඉන්දියානු 'වෛද්‍යවරයා' රිමාන්ඩ්" යනුවෙන් දිවයින සිරස්තලයේ සඳහන්ව තිබූ අතර, "සම්භාහනයට ගිය ඇමරිකන් තරුණියට අතවර කළැයි ඉන්දීය දොස්තර රිමාන්ඩ්" යනුවෙන් අරුණ සිරස්තලයේ සඳහන්ව තිබිණි.

ලිංගික අතවරයක් යනු නීතියෙන් දඬුවම් ලැබෙනා වරදක් වන අතරම, එය සමාජ ගැටළුවක් ලෙසින්ද හඳුනාගත හැක. ඒ අනුව, එවැනි සිදුවීමක් වාර්තා කරනා පුවත් වාර්තාවකින් එම වරද සැහැල්ලු කොට ඉදිරිපත් වුවහොත්, එය ගැටළුවක් වේ. එය වක්‍රාකාරීව එවැනි සිදුවීම් සාමාන්‍යකරණය වීමටද හේතුවක් විය නොහැකිදැයි පාඨක අප ප්‍රශ්න කළ යුතු වේ.

එසේ නම්, වඩාත් යෝග්‍ය යැයි ඔබ තෝරාගන්නේ පහත කුමන සිරස්තලයද?

1) දිවයින - විදෙස් තරුණිය සම්භාහනය කරද්දී පිටපොට පැන්න ඉන්දියානු 'වෛද්‍යවරයා' රිමාන්ඩ්

2) අරුණ - සම්භාහනයට ගිය ඇමරිකන් තරුණියට අතවර කළැයි ඉන්දීය දොස්තර රිමාන්ඩ්